# අභියෝග ජයගත් තරුණයෝ



සැකසුම :

පී.ඩී.එම්.පී. ද සිල්වා

ගුරු සේවය

අරුග්ගොඩ ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය

“ඉටු කොට කළ යුතු යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
නුඹයි මගේ පුතා උතුම් ”

(ටිබෙට් ජාතික එස් .මහින්ද හිමි )

ඉහත කවියේ සදහන් පරිදි ලෝකයෙන් කෙතරම් නින්දා අපහාස බාධා පැමිණිය ද තම යහපත් කටයුතු ,යුතුකම් ආදිය නිසි පරිදි ඉටු කළ යුතු ය.

උත්සහයෙන් කටයුතු කිරීම,යුතුකම් නිසි පරිදි ඉටු කිරීම,වගකීමෙන් හා වගවීමෙන් කටයුතු කිරීම තුළින් අභියෝග ජයගත හැකි ය.

# මඝ මානවක ජාතකය

බුදුරජාණන් වහන්සේ උපාය කුසලතාවයෙන් ඉදිරියට ගිය තරුණයෙකු අරබයා මඝමානවක ජාතකය දේශනා කළ සේක.එම කතා පුවත මෙසේ ය.

පෙර දවසක මගධ රට රජගහ නුවර මගධ නමින් රජ කෙනෙක් විය. මෙම රජතුමාගේ පාලන කාලයේ බෝසතාණන් වහන්සේ එරට මචල ගමේ ඉතා ම කුලවත්, ධනවත් පවුලක කුමාරයෙක් ව උපන්හ. මේ පින්වත් කුමාරයාට මඝ යන නාමය තබන ලදි. කුමාරයා තරුණ වයසට එළඹෙත් ම මඝ මානවක යයි ප්‍රසිද්ධ විය.

උගත මනා ශිල්ප මැනවින් උගත් මඝ දෙමාපියන්ගේ ආශීර්වාද මත විවාහ දිවියට ඇතුළත් විය. හෙතෙම දැහැමි දිවි පෙවෙතක් ගත කළේ ය. නිරන්තරයෙන් පන්සිල් රැක්මෙහි නිරත විය. මඝ වාසය කළ නුවර පවුල් තිහක් පමණ වාසය කළෝ ය. දනපතියෙකු වූ මඝ තරුණයා විසින් එක් දවසක ගම මැද එක්තරා ස්ථානයක් පිරිසිදු කොට නවීකරණය කරන ලදි.



එහෙත් වෙනත් අයෙක් එම ස්ථානය අත්පත් කර ගත්තේ ය. කිසි ම කලබලයක් නොකළ මඝ මානවක එම ස්ථානය ඔහුට ම පවරා වෙනත් තැනක් පෙර පරිදි ම සකස් කළේ ය. එහෙත් තවත් අයෙක් එම ස්ථානය පැහැර ගත්තේ ය. එම ස්ථානය ද හැර දමා තවත් තැනක් සකස් කරන්නට

මඝ මානවක කටයුතු කළේ ය. එය ද තවකෙක් උදුරා ගත්තේ ය.

මේ අයුරින් කීප වතාවක් ම තමා සකස් කළ ස්ථාන අනුන්ට හිමි කළ හෙතෙම සිය උත්සාහය අත් නොහැරියේ ය. ඔවුන් සමග කලහයට නොගියේ ය. ඔවුන්ට මෛත්‍රිය ම වැඩී ය. ගම මැද මණ්ඩපයක් ඉදි කළ මඝ එහි සැප පහසු අයුරින් ආසන සකස් කොට පැන් පහසුව ද ඇති කළේ ය. මේ නිර්මාණයත් සමග ම මෙම ගම් වැසි තිස් දෙනෙකුගෙන් යුතු පිරිසක් මඝ සමග එක් ව කටයුතු කරන්නට විය.

මඝ මානවක මෙම පිරිස පන්සිල්හි පිහිටුවා ඔවුන් සමග සමාජ සේවා පුළුල් ව සිදු කළේ ය. මහා මාර්ග ප්‍රතිසංස්කරණය, වැව් පොකුණු ඉදි කිරීම, අම්බලම් ඉදි කිරීම ආදී සේවාවන්හි ඔවුහු නියැලුණෝ ය; සෑම විට ම ධාර්මික ව කටයුතු කළෝ ය. එසේ ඔවුන් ධාර්මික ව කටයුතු කරන විට එම ගමේ ජනතාව ද ධාර්මික ව කටයුතු කිරීමට පටන් ගත්හ. මචල ග්‍රාමය සෑමට ම ආදර්ශවත් ගමක් විය.

ගම සදාචාර සම්පන්න වීම එහි පාලකයා නුරුස්සන කරුණක් විය. වැරැදිකරුවන් නොවීමත්, දඩ මුදල් අය කර ගැනීමට නොහැකි වීමත් මේ නුරුස්සන බවට හේතුව විය. හෙතෙම රජු හමු වී, ගමේ මං පහරන්නන් පිරිසක් ඇති බවත්, ඔවුන්ගෙන් ජනතාවට කරදර සිදු වන බවත් පැමිණිලි කර

මඝ මානවකගේ නිවසෙහි සුධර්මා, චිත්‍රා, නන්දා, සුජාතා නමින් කාන්තාවෝ සතර දෙනෙක් වූහ. මෙකල මඝ ඇතුළු පිරිස නගර මධ්‍යයේ විශාල ශාලාවක් ඉදි කළහ. සුධර්මා විසින් එහි කැණිමඬල තනවා දෙන ලදි. එපමණක් නොව මණ්ඩපය සමීපයේ පැන් හල් පිහිටුවා, එය වට කොට පවුරක් ද බඳවන ලදි. පවුර සමීපයේ තල් පැළ සිටුවා අලංකාර කරන ලදි. චිත්‍රාවෝ මණ්ඩපය සමීපයේ සිත්කලු උද්‍යානයක් ඉදි කළහ. නන්දා විසින් මනරම් පොකුණක් සාදවන ලදි. එහෙත් සුජාතාවගෙන් කිසිදු දායකත්වයක් නොලැබිණ. මඝ මානවක ද පහත සඳහන් උතුම්වත් සතක් ආරක්ෂා කරමින් කටයුතු කළේ ය.

**මවුපියන් පෝෂණය කිරීම, කුල දෙටුවන් පිදීම, ඇත්ත කථා කිරීම, මෘදු මොළොක් වචන කථා කිරීම , කේළාම් නොකීම, මසුරු නොවීම, ක්‍රෝධ නොකිරීම හෙවත් මෛත්‍රී කිරීම එම වත් සත ය.** මේවා ආරක්ෂා කරමින් මඝ ඇතුළු පිරිස ධාර්මික ව ජීවිත ගත කොට මරණින් පසු දෙව්ලොව උපත ලැබූහ. කිසිදු පොදු වැඩකට සහභාගි නොවූ සුජාතා ඒ අතර නොවූවා ය.

අභියෝගයන්ට මුහුණ දෙමින්, කණ්ඩායම් හැඟීමෙන් යුතු ව කටයුතු කිරීමෙන් හා සිය වගකීම් ඉටු කිරීමෙන් මඝ ඇතුළු පිරිස මෙලොව වශයෙන් ලත් ජයග්‍රහණ අප කාහටත් පූර්වාදර්ශයක් වන්නේ ය.






08


10


14


12


18



සත්‍ය වටහාගත් රජතුමා ඔවුන්ට බොහෝ රාජ සම්මාන වරප්‍රසාද ලබාදී, ගම්මුලාදෑනි තැනගේ දේපල රාජ සන්තකකොට මේ තරුණයන්ගේ සමාජ සේවාවන්ට තව තවත් උදව් කළා. මඝ ලස්සන ලෝකයක් ගොඩ නඟමින් ඔහුගේ සිහිනය සැබෑවක් බවට පත්කළා.

# ඇගයීම

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1.මගධ රට රජගහ නුවර පාලකයා කවු ද?

2.මඝ මානවකයා උපත ලැබූ ගම කුමක්  ද?

3.මඝ මානවකයා ආරක්ෂා කළ සීලය කුමක් ද?

4.මඝ මානවකයාගේ අනුගාමික පිරිස කොපමණ ද?

5.මඝ මානවකගේ බිරින්දෑවරු නම් කරන්න.

6.මඝ ඇතුළු පිරිස නගර මධ්‍යයේ ඉදිකළ ශාලාවේ කැණිමඬල ,පැන්හල් පිහිටුවීම,පවුරු සෑදීම සිදුකළේ කවු ද?

7.මණ්ඩපය සමීපයේ උද්‍යානයක් ඉදිකළේ කවු ද?

8.මණ්ඩපය සමීපයේ මනරම් පොකුණක් ඉදිකළේ කවු ද?

9.දිනපතා පින් වැඩෙන ක්‍රියා මොනවා ද?

10.එකමුතු ව වැඩ කිරීමේ අගය පෙන්වා දෙන වාක්‍ය පහක් ලියන්න.

# පිළිතුරු

1.මගධ රජතුමා.

2.මචල ගමේ.

3.මවුපියන් පෝෂණය කිරීම.

- කුල දෙටුවන් පිදීම.
- ඇත්ත කථා කිරීම.
- මෘදු මොළොක් වචන කථා කිරීම.
- කේළාම් නොකීම.
- මසුරු නොවීම.
- මෛත්‍රී කිරීම.

4.තිස් දෙනෙකි .

5.සුධර්මා,චිත්‍රා,නන්දා හා සුජාතා.

6.සුධර්මා විසිනි.

7.චිත්‍රා විසිනි.

8.නන්දා විසිනි.

9.මංමාවත් සෑදීම.

පැන් පොකුණු තැනීම.

අම්බලම් ශාලා ආදිය තැනීම.

# පුහුණුවට

" මාතාපෙත්ති භරං ජන්තුං -කුලේ ජෙට්ඨාපචායිනං

සණ්හං සඛිල සම්භාසං -පේසුණෙය්‍යප්පහායිනං

මච්ඡේර විනයේ යුත්තං -සච්චං කෝධාභිභූං නරං

තං වේ දේවා තාවතිංසා -ආහු සප්පුරිසෝ ඉති "

මවුපියන් පෝෂණය කරන,කුල දෙටුවන් පුදන,ඇත්ත කථා කරන,මුදු මොළොක් වචන භාවිත කරන,කේලාම් නොකියන,මසුරු නොවන ,ක්‍රෝධ නොකරන තැනැත්තා,තව්තිසාවෙහි දෙවියන් විසින් සත්පුරුෂයෙකු ලෙස හඳුන්වනු ලැබේ.